# ජනමතය



6645

# ජනමතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

# ආණ්ඩුවේ නිවේදන

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනත
64 (2) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ 56 වන වගන්තිය යටතේ, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා ලෙස තෝරා පත්කර ගත් ලෙස ප්‍රකාශයට පත් කළ බව, මැතිවරණ කොමසාරිස්, රාහුබද්දෙ කංකානම්ගේ චන්ද්‍රානන්ද ද සිල්වා වන මම, එම පනතේ 64 (2) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

ආර්. කේ. චන්ද්‍රානන්ද ද සිල්වා
මැතිවරණ කොමසාරිස්

1994 නොවැම්බර් මස 10 වන දින,
ශ්‍රී ජයවර්ධනපුර දී ය.

## මැතිවරණ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජනාධිපතිවරණයේ අවසාන ප්‍රතිඵල මෙසේය.

| | |
|---|---|
| චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග | **47,09,205** |
| (පොදුජන එක්සත් පෙරමුණ) | (62.28%) |
| ශ්‍රීමා දිසානායක | **27,15,283** |
| (එක්සත් ජාතික පක්ෂය) | (35.91%) |
| හඩ්සන් සමරසිංහ | **58,886** |
| (ස්වාධීන) | (0.78%) |
| හරිස්චන්ද්‍ර විජයතුංග | **32,651** |
| (සිංහලයේ මහා සම්මත භූමිපුත්‍ර පක්ෂය) | (0.43%) |
| ඒ. ජේ. රණසිංහ | **22,752** |
| (ස්වාධීන) | (0.30%) |
| නිහාල් ගලප්පත්ති | **22,749** |
| (ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ) | (0.30%) |
| වලංගු ඡන්ද සංඛ්‍යාව | 75,61,526 |
| | (98.03%) |
| ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව | 1,51,706 |
| | (1.97%) |
| ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව | 77,13,232 |
| | (70.52%) |
| ලියාපදිංචි මුළු ඡන්ද සංඛ්‍යාව | 1,09,37,279 |
| වැඩි ඡන්ද සංඛ්‍යාව | **19,93,927** |

# මහජන මනාපයක විශිෂ්ට සම්මානයක්

මැතිවරණ කොමසාරිස්තුමනි, මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුනි, නෝනාවරුනි, ශ්‍රී ලංකා ජනරජයේ ඇමතිවරුනි, එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු නියෝජිතවරුනි, ශ්‍රී ලංකා කොමියුනිස්ට් පක්ෂයේ නායකතුමනි, ශ්‍රී ලංකා මහජන පක්ෂයේ නායකතුමනි, ඒ. ජේ. රණසිංහ මැතිතුමනි, සම්භාවනීය අමුත්තනි, පළමුවෙන් ම අද දින පොදු ජන එක්සත් පෙරමුණ ජයග්‍රහණයට පත්කරවමින් අප රටේ තුන් වැනි ජනාධිපති හැටියට මා පත් කර ගැනීමට අතිවිශාල ඡන්ද ප්‍රමාණයක් පාවිච්චි කරමින් කටයුතු කළ අපගේ ජනතාවට මගේත්, පක්ෂයේත්, හෘදයංගම ස්තුතිය පුද කරන්නට මේ අවස්ථාවේ දී මා කැමතියි.

ඒ වගේ ම මේ ජයග්‍රහණය සහතික කරන්නට කටයුතු කරපු අප පක්ෂයේ සියලුම නායකවරුන්ටත් ක්‍රියාකාරීන්ටත් අනේක කරදර දුක්ගැහැට මැද්දේ පක්ෂයේ ධජය වසර 17ක් තිස්සේ ඔසවා ගෙන ගොස් මේ ජයග්‍රහණය කරා ගමන් කරන්නට පක්ෂයට, පක්ෂය වෙනුවෙන් සියලුම කැපවීම් කරපු අපගේ ප්‍රධාන ක්‍රියාකාරින්ට මේ අවස්ථාවේ මාගේ අවංක ස්තුතිය පුද කරනවා.

මෙම ජයග්‍රහණය මගේ පෞද්ගලික ජයග්‍රහණයක් නොවන බව මා ප්‍රකාශ කරන්නට කැමතියි. දීර්ඝ කාලයක් තිස්සේ දුර්දාන්ත පාලනයක් යටතේ නොයෙකුත් දුක්, කරදර, තර්ජන, මර්දන, මිනීමැරුම්වලට මුහුණ දුන් ජනතාවගේ දුක් කඳුළු වේදනාවන් තුළින් ඔවුන් විසින් ගොඩනගාගත් ජයග්‍රහණයක් හැටියට මෙය මා දකින බව මේ අවස්ථාවේ දී පැහැදිලි කරන්න කැමැතියි.

අප රටේ ජනතාව මේ ජයග්‍රහණය තුළින් ලබාගෙන තිබෙන විශිෂ්ටම ජයග්‍රහණය වන්නේ සියලු ම්ලේච්ඡ තිරිසන් ක්‍රියාවන් ප්‍රතික්ෂේප කර, ප්‍රජාතන්ත්‍රවාදය රජ කරමින් ඔවුන්ට එරෙහිව තුවක්කු, බෝම්බ සියල්ල දික් කරද්දීත්, රාජ්‍ය ත්‍රස්තවාදය ඔවුන්ට එරෙහි ව නොයෙක් ආකාරයට කටයුතු කරද්දීත් තමන් සතු අගනාම අවිය වන ඔවුන්ගේ නිදහස් ඡන්දය පාවිච්චි කර මේ ජයග්‍රහණය ලබා ගැනීමයි කියල අපි මේ අවස්ථාවේ දී අමතක කළ යුතු නැහැ. සකලවිධ ශ්‍රී ලංකාවාසී ජනතාව අති විශිෂ්ට ලෙස මිනිස් නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය අද රජකරවා තිබෙන බව මේ අවස්ථාවේදී අපි ප්‍රකාශ කරන්න කැමතියි. බොරුව, වංචාව ප්‍රතික්ෂේප කර ජාතිවාදය ප්‍රතික්ෂේප කර, දිගින් දිගටම මේ



මැතිවරණ සටනේ දී විශේෂයෙන් පසුගිය සති දෙක ඇතුළත දී නීච විදිහට, පහත් විදියට ජාතිවාදී හැඟීම් අවුස්සන්නට හැදූ ප්‍රතිවිරුද්ධ සමහර පක්ෂවල ඒ කැත ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර, මේ රටේ සාමය සඳහා, මිනිස්කම සඳහා ජනතාව දශලක්ෂ සංඛ්‍යාත ගණනින් අප රජයට ලබාදුන්න සහතිකයක් හැටියට අපි මෙය දකිනවා.

ඒ සියල්ල ඉදිරියේ අප රජය ජාතිවාදය, නැමති මේ භයානක ප්‍රතිපත්තියට හිස නමන්නේ නැති ව, අප විසින් ආරම්භ කරන ලද සාම ප්‍රයත්න ප්‍රතික්ෂේප කරන්නේ නැතිව, මේ රටේ ජීවත්වන බහුතර සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර තහවුරු කරන්නට ප්‍රතිඥා දෙන අතර, අප සමහ ජීවත්වන සියලුම ජාති ආගම්වලට අයත් කුලවලට අයත් උස් පහත් සියලු දෙනාගේම සමාන අයිතිවාසිකම් තහවුරු කර දෙන්නට වගකිවයුතු ජනතාවගේ රජයක් හැටියට මේ අවස්ථාවේ දී නැවත වතාවක අපි ප්‍රතිඥා දෙනවා.

මේ ජයග්‍රහණය අපි දකින්නේ පොදුජන එක්සත් පෙරමුණ රජයේ මාස දෙකහමාරක ජීවිත කාලයක් තිස්සේ අනුගමනය

කරන ලද ප්‍රතිපත්ති වෙනුවෙන් ජනතාව විසින් ලබාදුන් පැහැදිලි ශක්තිමත් සහතිකයක් හැටියටයි. මේ රටේ ජාතිවාදී යුද්ධය නවත්වා සාමය ලබා ගන්නට අප ගත් ප්‍රයත්නයට, ප්‍රජාතන්ත්‍රවාදය මරා දමා, තිරිසන්කම රජ කළ ඒ ම්ලේච්ඡ යුගය ප්‍රතික්ෂේප කරමින්, මිනිස් අයිතීන්, මිනිස් නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය රජ කරන සමාජයක් නැවත වතාවක් බිහි කරන්නට අප විසින් කටයුතු කර තිබෙන ආකාරයට රාජ්‍ය තන්ත්‍රයේ ඉහළ සිට පහළ දක්වා ස්ථාපිත කර තිබුණේ, හොරකම, දූෂණය ප්‍රතික්ෂේප කර දූෂණයෙන් තොර, අවංක ජනතා පාලනයක් පිහිටුවන්නට මේ මාස දෙකහමාර තුළ අප විසින් කරන ලද ප්‍රයත්නයන්ට, සුළු අතළොස්සක් පමණක් සියලු වරප්‍රසාද අනිසි ලෙස ලබාගෙන අවුරුදු 17ක් තිස්සේ මේ රටේ ක්‍රියාත්මක වුණ ඒ ප්‍රතිපත්තිය වෙනුවට මුළු මහත්, ජනතාවට, විවෘත ආර්ථිකයක වරප්‍රසාද ලබාදෙමින්, අවංක ව විවෘත ව ක්‍රියාත්මක වන, සියලු ජනකොටස්වලට ආර්ථිකයේ වරප්‍රසාද ලබාදෙන නව ආර්ථික පිළිවෙතක් සඳහා අප විසින් ආරම්භ කරන ඒ මූලික පියවරට, ජනතාව ලබාදෙන සහතිකයක් හැටියට අපි මේ ජයග්‍රහණය දකිනවා. ඒ නිසා, අපගේ ඒ ප්‍රතිපත්තීන් තවදුරටත් ශක්තිමත් ව මීටත් වඩා සාර්ථක ව ඉදිරියට ගෙන යන්නට මේ අවස්ථාවේ දී අපි ප්‍රතිඥා දෙනවා.

අපි ජනතාවගෙන් ඉල්ලා සිටි ශක්තිමත්, සහතිකය කිසි ම පැකිළීමකින් තොරව අතිවිශිෂ්ට ලෙස, ශක්තිමත් ලෙස, චාරිත්‍රානුගත ලෙස අපට ලබා දී තියෙනවා. ඒ ජයග්‍රහණයේ ප්‍රණාමය අපි මේ රටේ ජනතාවට පුද කළ යුතුයි. අපේ ජනතාව දුප්පත් වුණත්, රට පුංචි වුණත්, මුළු ලෝකයා ඉදිරියේ ම ප්‍රජාතන්ත්‍රවාදය සඳහා, සියලු බාධක මැද්දේ

බුද්ධිමත් ව, අවංක ව, ශක්තිමත් ව, නැඟී සිටින්නට සූදානම් බව මේ මැතිවරණයෙන් ඉතා මත් පැහැදිලි ව ප්‍රකාශ කර තියෙනවා.

පසුගිය මාස 18 ඇතුළත අප රටේ පැවතුණු මැතිවරණ හතරේ දී ම අප රටේ ජනතාව ඒ ආකාරයට ඡන්දය ප්‍රකාශ කර තිබෙනවා. මැතිවරණයෙන් මැතිවරණයට වැඩි ඡන්ද ප්‍රමාණය වැඩි කරමින් අපට ලබාදුන් ඒ සහතිකය ඉතා පැහැදිලි ව ප්‍රකාශ කරන්නේ මේ රටේ ජනතාව සියලු තර්ජන, බාධක මැද්දෙන් නිර්භීත ව, ඍජු ව, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, නිදහස් මැතිවරණ වෙනුවෙන් කටයුතු කරන්න සූදානම් බවයි. ජනතාවගේ ඒ අයිතීන් සම්පූර්ණයෙන් ම අපි ආරක්ෂා කරන්නට බැඳී සිටින අතර, අපට භාර දී තිබෙන අතිවිශාල භාරදූර වගකීම පැහැදිලි ව වටහා ගෙන අවංක ව, බුද්ධිමත් ව, සාර්ථක ව ජනතාවගේ නායකත්වයෙන් ඉදිරියට ගෙනයන්නට අප බලාපොරොත්තු වන බව මේ අවස්ථාවේ දී මතක් කරනවා. මේ සියල්ලට ප්‍රධාන වශයෙන් හේතු සාධක වුණ, ඒකාධිපති, විධායක ජනාධිපති ක්‍රමය, නමුන්නාන්සේලා අපට ලබාදුන්න මේ වරමින්, 1995 ජූලි 15 වන දාට පෙර අහෝසි කරන්නට කටයුතු කරන බවත් ප්‍රකාශ කරනවා. ජනතාවගේ බලය, ශක්තිය ධෛර්යය ජනතාවගේ ඡන්දයෙන් මේ ආකාරයට, අපට, රජයට ලබා දෙනවා නම් හදිසි නීතිය, අනිසි බලතල, ඒකාධිපති බලතල අපට කිසි සේත් ම අවශ්‍ය වන්නේ නැති බව මා ප්‍රකාශ කරන්නට කැමතියි. අන්තිම වශයෙන් නොයෙකුත් බාධක සීමාවක් තුළ මුළු මැතිවරණ ක්‍රමයටම භයංකාර තර්ජන තිබිය දීත් පසුගිය වසර ගණනාව ඇතුළත මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කිරීම පිණිස නිදහස් මැතිවරණය

රැකගැනීමට ඉතා මත් අවංකව පක්ෂ භේදයෙන් තොර ව කටයුතු කළ මැතිවරණ කොමසාරිස්තුමා ඇතුළු මැතිවරණ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සියලු දෙනාට අපගේ අවංක ස්තුතියත් ප්‍රණාමයත් පුද කළ යුතු ව තිබෙනවා. ඒ වගේම මේ මැතිවරණය සාර්ථක ක්‍රියාත්මක කරවන්නට රෑ දවල් නොබලා විශාල බාධක මැද්දේ පහසුකම් සීමාවන් තුළ කටයුතු කළ දස දහස් ගණනාවක රජයේ නිලධාරීන්ටත්, අපගේ ස්තුතිය මේ අවස්ථාවේ පුදකරනවා. සාමය රකින්නට කටයුතු කළ පොලිසියේ නිලධාරීන්ටත් ඔවුන්ට සහාය වුණ හමුදා නිලධාරීන්ටත් ඒ වගේම අපගේ අවංක ස්තුතිය පුද කළ යුතු ව තිබෙනව. මේ මැතිවරණය ප්‍රජාතන්ත්‍රවාදී ව කටයුතු කරන්නට, ක්‍රියාත්මක කරවන්නට, සාමය ආරක්ෂා කරන්නට, මැතිවරණ කොමසාරිස්වතුමාට හා රජයට ලබාදුන් සහාය පිළිබඳ ව සියලුම ජනාධිපති ධුර අපේක්ෂක අපේක්ෂිකාවන්ටත්, ඔවුනගේ පක්ෂවලටත්, මගේ අවංක ස්තුතිය පුද කරනවා. මේ රටේ ජනතාව, සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් හා සියලුම ආගම්වල ජනතාව ඇතුළු සියලු ජනකොටස්වල ජනතාව, අතිවිශාල වශයෙන් අපි තුළ තැබූ ඒ විශ්වාසය කිසිසේත්ම කිලිටි වෙන්නට ඉඩ තියන්නේ නැතිව, ජනතාවගේ ඒකාධිපති පාලකයන් හැටියට නොව ජනතාවගේ නිහතමානී සේවකයන් හැටියට, අපට භාරදුන් ඒ වගකීම සාර්ථකව ක්‍රියාත්මක කරන්නට, අප ඇප කැප වන බව මතක් කරමින් ඔබ සැමට ස්තුතියි.

අතිගරු ජනාධිපතිනි
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය
1994.11.10 දින මැතිවරණ මහ කොමසාරිස්
කාර්යාලයේ දී පැවැත් වූ කථාව

## ජනාධිපතිනිය ලෙස ඡන්දයෙන් තේරී පත්ව සිටින අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් වර්ෂ 1994 නොවැම්බර් මස 12 වැනි දින ජනාධිපති ධූරය භාරගනු ලැබීම පිළිබඳ නිවේදනය

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) ව්‍යවස්ථාව සමග කියවනු ලබන එකී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (3) ව්‍යවස්ථාව ප්‍රකාර පවත්වන ලද ඡන්ද විමසීමක දී අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වර්ෂ 1994ක් වූ නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනිය ලෙස මහජන ඡන්දයෙන් තේරී පත්ව ඇති බව ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, වර්ෂ 1981 අංක 15 දරන ජනාධිපතිවරණ පනතේ 56 (2) වගන්තිය යටතේ අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිනිය ලෙස තේරී පත්ව ඇති බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් එකී පනතේ 64 (2) වගන්තිය යටතේ නිවේදනය කර ඇති හෙයින් ද,

තව ද, පූර්වෝක්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (4) ව්‍යවස්ථාව අනුව පූර්වෝක්ත ජනාධිපතිනිය ගේ ධූර කාලය වර්ෂ එක් දහස් නමසිය අනූහතරක් වූ නොවැම්බර් මස 10 වැනි දින ආරම්භ වූ හෙයින් ද,

අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් වර්ෂ එක් දහස් නමසිය අනූහතරක් වූ නොවැම්බර් මස 12 වැනි දින ශ්‍රී ලංකාවේ කොළඹ, ගාලුමුවදොර පිහිටි ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැත්වෙන මෙම චාරිත්‍රානුකූල උත්සවයේදී, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, පිළිවෙළින් 32 (1) ව්‍යවස්ථාවෙන් හා 157 අ (7) ව්‍යවස්ථාවෙන් විධිවිධාන යොදා ඇත්තා වූ ආකාරයට පූර්වෝක්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සතර වැනි හා සත් වැනි උපලේඛනයන්හි දක්වා ඇති ප්‍රතිඥාවන් දී ඊට අත්සන් තැබීමෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරය එතුමිය විසින් භාරගනු ලබන බව මෙයින් නිවේදන කරනු ලැබේ.

කේ. එච්. ජේ. විජයදාස
ජනාධිපති ලේකම්

## ජනාධිපතිනිය ලෙස තේරී පත්ව ඇති
## අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය
## ජනාධිපති ධූරය භාර ගැනීම

ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 30 (2) හා 31 (3) යන ව්‍යවස්ථා ප්‍රකාර, වර්ෂ 1994 නොවැම්බර් මස 9 වැනි දින පවත්වන ලද ජනාධිපතිවරණයේ දී අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකා ජනාධිපතිනිය ලෙස තේරී පත් ව ඇති බව මැතිවරණ කොමසාරිස්වරයා විසින් 1981 අංක 15 දරන මැතිවරණ පනතේ 64 (2) වන වගන්තිය යටතේ නිවේදනය කර තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 31 (4) ව්‍යවස්ථාව අනුව, නව ජනාධිපතිනිය ගේ ධූර කාලය 1994 නොවැම්බර් මස 10 වැනි දින, එනම්, මැතිවරණ කොමසාරිස්වරයා විසින් ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන ලද දින ආරම්භ වූයේ ය.

1994 නොවැම්බර් මස 12 වැනි දින වන අද දින, කොළඹ ගාලුමුවදොර පිහිටි ජනාධිපති ලේකම් කාර්යාලයේ පැවැති දිවුරුම්දීමේ චාම් උත්සවයක දී අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ශ්‍රී ලංකාවේ අග්‍ර විනිශ්චයකාර ගරු ජී. පී. එස්. ද සිල්වා මහතා ඉදිරියේ ශ්‍රී

ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙළින් 32 (1) ව්‍යවස්ථාවෙන් හා 157 අ (7) ව්‍යවස්ථාවෙන් විධිවිධාන යොදා ඇති ආකාරයට, පූර්වෝක්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සතර වැනි හා සත් වැනි උපලේඛනයන්හි දක්වා ඇති ප්‍රතිඥාවන් දී ඒවාට අත්සන් තැබීමෙන් ශ්‍රී ලංකා ජනාධිපති ධූරය භාරගත්තාය.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සතර වැනි හා සත් වැනි උපලේඛනයන්හි එන දිවුරුම/සහතික ප්‍රකාශ සම්පූර්ණයෙන් මෙසේ ය :

*සතර වැනි උපලේඛනය ප්‍රකාර දිවුරුම/සහතික ප්‍රකාශය*

"චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධූරයෙහි කාර්යයන් හා කර්තව්‍යයන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට අනුකූලව අවංකව ඉටු කරන බවට ද, ශ්‍රී ලංකා ජනරජයට පක්ෂපාත වන බවට ද, මාගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කොට අනුගමනය කරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි."

*සත්වැනි උපලේඛනය ප්‍රකාර දිවුරුම්/සහතික ප්‍රකාශය*

"චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂාකොට අනුගමනය කරන බවට ද, ශ්‍රී ලංකා භූමිය තුළ වෙනම රාජ්‍යයක් පිහිටුවීමට කෙළින්ම හෝ අතියමින් හෝ, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී ආධාරදීම, අනුබලදීම, අනුග්‍රහය දැක්වීම, මුදල් යෙදවීම, ධෛර්යයදීම හෝ දේශනා කිරීම නොකරන බවට ද ගෞරව බහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි."

මෙම චාරිත්‍රානුකූල උත්සවය ආරම්භයේ දී නව ජනාධිපතිනිය සිය ධූරය භාරගැනීම පිළිබඳ මේ සමඟ වන නිවේදනය කේ. එච්. ජේ. විජයදාස මහතා විසින් කියවන ලදී.

මෙම උත්සවය පවත්වන ලද්දේ, ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාවේ ය. එනම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගරයේ ඉදිකළ නව ගොඩනැගිල්ලට ගෙන යෑමට ප්‍රථම පැවැති පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ සභාගර්භයේ දී ය.

මෙම අවස්ථාවට ආරාධිත වූ සම්භාවනීය අමුත්තන් අතර කථානායකතුමා, නියෝජ්‍ය කථානායකතුමා, කැබිනට් අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු හා රජයේ පාර්ලිමේන්තු කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ද තානාපතිවරු ද වූ හ.

1994 නොවැම්බර් මස 12 වැනි දින.

# චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ජීවන තොරතුරු

උපන් දිනය : 1945 ජුනි 29 වන දින

උපන් ස්ථානය : කොළඹ, ශ්‍රී ලංකාව.

විවාහක අවිවාහක තත්ත්වය : වැන්දඹු (1978 පෙබරවාරි 20 වන දින විවාහ විය)

ස්වාමිපුරුෂයා : විජය කුමාරතුංග, ප්‍රධාන පෙළේ විපක්ෂයේ සිටි පුද්ගලයෙක්, චිත්‍රපට නළුවෙක්, 1988 පෙබරවාරි 16 වන දින ඝාතනය කරනු ලැබිණි.

දරුවෝ : දියණිය යසෝධරා (වයස අවු. 14යි) හා පුත්‍රයා විමුක්ති (වයස අවු. 12යි)

පියා : එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරණායක, ශ්‍රී. ල. නි. ප. ආරම්භකයාය. 1956 සිට 1959 සැප් 26 වන දින දක්වා අගමැතිධුරය හෙබවීය.

මව : සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරණායක, ඡන්දයෙන් තේරී පත්වූ ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරියයි. 1960 සිට 1965 දක්වාද නැවත වරක් 1970 සිට 1977 දක්වාද එතුමිය රට පාලනය කළාය.

වත්මන් තත්ත්වය : ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනපතිනියයි

වෙනත් තත්ත්ව : 1. පොදු පෙරමුණේ උප සභාපතිනිය,

2. ශ්‍රී. ලං. නි. පක්ෂයේ නියෝජ්‍ය නායක

3. අගමැතිනිය වශයෙන් තේරී පත්වන තුරු 1993 මැයි මාසයේ සිට බස්නාහිර පළාත් සභාවේ මහ ඇමතිනිය ලෙස කටයුතු කළාය.
4. වර්ෂ 1994 අගෝස්තු 19 වන දින සිට ජනපතිනිය වශයෙන් තේරීපත්වන තුරු ශ්‍රී ලංකාවේ අගමැතිනිය වශයෙන් කටයුතු කළා.

1992 – ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍ය කාරක සභාවේ සාමාජිකාවකි. අත්තනගල්ල මැතිවරණ කොට්ඨාසයේ ශ්‍රී. ල. නි. පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරියයි.

1986 – ශ්‍රී ලංකා මහජන පක්ෂයේ සභාපතිනියයි.

1985 – 1977 'දිනකර' දෛනික සිංහල පුවත්පතේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ

1984 – ශ්‍රී. ලං. ම. පක්ෂයේ උප සභාපති

1980 – ශ්‍රී. ලං. නි. පක්ෂයේ විධායක කමිටුවේ හා ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකාවකි.

1974 – ශ්‍රී. ලං. නි. පක්ෂයේ කාන්තා සංවිධානයේ විධායක කමිටුවේ සාමාජිකාවකි.

වෘත්තිය තොරතුරු

1988 – 1991 පර්යේෂණ සහායක – පොදු රාජ්‍ය මණ්ඩලීය අධ්‍යාපන ආයතනය, ලන්ඩන් විශ්වවිද්‍යාලය

1978 – 1979 විශේෂඥ උපදේශක ආහාර හා කෘෂිකර්ම සංවිධානය

1976 – 1977 ජනාවාස කොමිසමේ සභාපති


1972 – 1976 අතිරේක ප්‍රධාන අධ්‍යක්‍ෂ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

අධ්‍යාපනය – දේශපාලන විද්‍යාව පිළිබඳ උපාධිය (පැරිස් විශ්වවිද්‍යාලය)

සංවර්ධන ආර්ථික අධ්‍යයනය පිළිබඳ ආචාර්ය උපාධි අධ්‍යයනය (පැරිස් විශ්වවිද්‍යාලය), නීති උපාධිය පිළිබඳ එල්එල්බී උපාධිය, පැරිසියේ ලේ – මොන්ඩාහි දේශපාලන පුවත්පත් කලාව පිළිබඳ පුහුණුව, කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයෙන් පාසල් අධ්‍යාපනය ලබා ඇත.

භාෂා – සිංහල, ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂා මැනවින් කථාකළ හැකිය.

ප්‍රකාශන – "ජනාවාස ව්‍යාපාරය, ශ්‍රී ලංකාවේ සංවර්ධනය සඳහා අනාගත තාක්ෂණ ක්‍රම"



පර්යේෂණ කරන ලද දෑ - ශ්‍රී ලංකාවේ දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා (මෙය දැනට පිළියෙල කරමින් තිබේ.) ශ්‍රී ලංකාවේ සමූපාකාර ව්‍යාපාරය (පර්යේෂණ ලිපිය)

ශ්‍රී ලංකාවේ ඉඩම් හා ගොවි කටයුතු ප්‍රතිසංස්කරණයන් (පර්යේෂණ ලිපියකි.)

1948 සිට අද දක්වා ශ්‍රී ලංකාවේ ආහාර ප්‍රතිපත්ති හා උපායක්‍රම වයිඩර් ආයතනයේ ප්‍රකාශනයකි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා සමාජ ව්‍යුහය (පර්යේෂණ ලිපියකි.)

පොදු - නවදිල්ලියේ ජවහර්ලාල් නේරු විශ්වවිද්‍යාලයේත් මහා බ්‍රිතාන්‍යයේ බ්‍රැඩ්ෆෝර්ඩ් විශ්වවිද්‍යාලයේත් ආරාධිත දේශකයෙකි.

# බල සුබ නිමිති ගිරි කුළ මත සඳක් නගී

ශ්‍රී ලංකාවේ හතර වැනි ජනාධිපති ලෙස මා එම ධුරයේ කටයුතු භාරගන්නේ අප රටේ ඉතිහාසයේ ඉතා වැදගත් සන්ධිස්ථානයකදීයි අප රටේ ජනතාව, සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙනුත්, අවංක හා කාර්යක්ෂම පාලන තන්ත්‍රයක් ගොඩනැගීම සඳහාත් හෙංවයියන් සහ හිතවතුන් අතළොස්සකට පමණක් සීමා වී තිබුණු වරප්‍රසාද සැමදෙනාටම එකසේ ලැබෙන ආර්ථික ප්‍රතිපත්තියක් වෙනුවෙනුත්, තමන් තුළ ඇති සාමූහික අභිලාෂය ඉතා බලසම්පන්නව පසුගිය මැතිවරණයේදී ප්‍රකාශ කර තිබෙනවා.

මා පළමුවෙන්ම හිස නමා අචාර කරන්නට කැමැතියි, අප රටේ පොදු මහත් ජනතාවට, දීර්ඝ කාලයක් තිස්සේ මේ රට

වෙලා ගෙන පැවතුණු තර්ජනයත්, මර්දනයත් ඉදිරියේ දී අභීතව තියුණු දේශපාලන බුද්ධියක් ඇතිව, අතිවිශාල කැපවීමක් ඇතිව අප රට නැවත වතාවක් උතුම් මිනිසුනට ජීවත්වෙන්නට පුළුවන් රටක්, ආණ්ඩුවක්, සමාජයක් බිහි කරන්නට ඔවුන් කටයුතු කිරීම ගැන.

ඒවගේම, මේ අවස්ථාවේ දී, මම මගේ පියාණන්ටත්, මෑණියන්ටත් මගේ හිස නමා ගෞරවය, භක්තිය සහ ස්තුතිය පුද කරන්නට කැමැති වෙනවා, ජනතා සේවයේදී අවංකකම, කැපවීම, මිල මුදල් සහ අනිකුත් සියලුම බලතලවලට වැඩිය වටිනා බව මට පෙන්නාදීම සහ ඉගැන්වීම ගැන. ඒ වගේම අපගේ දේශපාලන සටනේදී දිගින් දිගටම මට ශක්තිය, ධෛර්යය ලබා දුන්, අවංකකමේ අගය පෙන්වා දුන්, මාගේ ස්වාමිපුරුෂයාටද මේ අවස්ථාවේදී හිස නමා ගෞරව කරන්නට මා කැමැතියි.

අපේ ජනතාව මාත් මගේ ආණ්ඩුවත් කෙරෙහි දක්වා ඇති මේ අති මහත් විශ්වාසය නිසා මා තුළ ඇති වූ තියුණු සංවේදී හැඟීම් මෙන්ම ජනතාව පිළිබඳව මා තුළ ඇති වූ ගෞරවය නිසි ලෙස ප්‍රකාශ කිරීමට වචන මා වෙත නැති තරම්. ජනතාව අපට දී ඇති මේ තරම් විශාල වරමක් ප්‍රජාතන්ත්‍රවාදී ලෝකයේ මැතිවරණ ඉතිහාසය තුළ තවත් නැති තරම්. එහි වැදගත්කම වඩාත් හොඳින් පෙනෙන්නේ, ශ්‍රී ලංකාවේ සෑම විවිධ ජන කොටසක්ම එකම නොසැලෙන හඬක් නගා ඇති බව සැලකිල්ලට ගත් විටයි.

මේ ජයග්‍රහණයේ අසමසම පරිමාව, එය හුදෙක් තනි පුද්ගලයෙකුගේ හෝ දේශපාන පක්ෂයක හෝ ජයග්‍රහණයක් ලෙස පමණක් සැලකීමෙන් නිසිලෙස තේරුම් ගත නොහැකිය.

මගේ සිතේ හදවතේ සහ අධිෂ්ඨානයේ යම්කිසි ශක්තියක් ඇත්නම් එය ජනතාවට සේවය කිරීම සඳහා මුළුමනින්ම කැප වූවක් බව අප ජනතාව හොඳින් දන්නවා. මගේ මුළු ජීවිතයම මා කැප කොට තිබෙන්නේ රටේ ශුභ සිද්ධිය හා යහපත වෙනුවෙනුයි. මේ අධිෂ්ඨානය සහ කැපවීම ශක්තිමත් ලෙස අලුත් කිරීමට අද ඉතා සුදුසු දවසක්.

කෙසේ වුවත් මේ ජයග්‍රහණය මට පමණක් අයිති වූවක් නොවේ. එය ශ්‍රී ලංකාවේ සමාජයේ සෑම කොටසක්ම මෑත අතීතයේ දී අපේ රට වසාගෙන පැවතුණු මුළු අඳුරු යුගය පුරාම දැරූ අප්‍රතිහත ධෛර්යයේත්, නොසැලෙන අධිෂ්ඨානයේත් මහඟු ප්‍රතිඵලයයි.

මෙම ජයග්‍රහණයේ පරිමාවෙන් පෙන්නුම් කෙරෙන්නේ රටක ජනතාවක්, තිසි අධිෂ්ඨානයෙන් සහ උද්යෝගයෙන් යුක්ත වූ විට, ඕනෑම බාධකයක් මැඩගෙන ඉදිරියට යාමටත් තමන් සහ අනාගත පරපුර වෙනුවෙන් ඉතාම දුෂ්ට, ප්‍රජාපීඩක පාලන තන්ත්‍රයකින් පවා විමුක්තිය අත්පත් කර ගැනීමට සමත් වන බවයි. මේ අවස්ථාවේදී මා මගේ උණුසුම් භක්ති ප්‍රණාමය පුද කරන්නේ අපේ රටේ මෑත කාලීන ඉතිහාසයේ ඉතාම අඳුරු කාලපරිච්ඡේදයකදී පවා, ඉමහත් දුෂ්කරතා මැද මේ අරගලයට දායක වී එය අඛණ්ඩව ඉදිරියට ගෙන ගිය අප රටේ බහුතර ජනතාවටයි. මගේ පියා වූ දිවංගත එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමාගේම වචනවලින් කියනවා නම් අපේ ජනතාවගේ යටපත් කළ නොහෙන, පාගාදමා නොහෙන ජීව ගුණයට පසුගිය දාහත් වසරක් පුරා පැවති මර්දනකාරී, ප්‍රජාපීඩක ආණ්ඩුවට අභියෝග කිරීමටත් අවසානයේදී එය පරාජය කිරීමටත් අවශ්‍ය තරම් වූ ශක්තිය තිබුණු බව දැන් ප්‍රත්‍යක්ෂ වී හමාරයි.



අපේ රටේ දැනට පවතින තත්වය ගැන නිසි තක්සේරුවක් කර මහජනතාවගේ හැඟීම් සහ අපෙක්ෂාවන් මේ තරම් ප්‍රබලව මතු වී ප්‍රකාශයට පත් වූයේ මන්ද කියා සිතා බැලීමට මෙය සුදුසු අවස්ථාවක්.

මටත් පොදුජන එක්සත් පෙරමුණටත් මේ තරම් විශාල ජයග්‍රහණයක් ලබාදීමට තමන් තුළ පැවති අධිෂ්ඨානය ප්‍රකාශයට පත් කිරීමෙන් පෙන්නුම් කර ඇත්තේ වෙනසක් සඳහා ඔවුන් තුළ ඇති, අති ප්‍රබල අභිලාෂයයි. ඔවුන් සිය ඡන්දය මගින් ප්‍රකාශ කර ඇති කැමැත්ත හරයාත්මකව මෙන්ම, සියල්ලටම පෙර වෙනසක් සඳහා වූ කැමැත්තක්, ශ්‍රී ලංකාවේ ඡන්දදායකයන් අපේක්ෂා කරන්නේ තීරණාත්මක මෙන්ම කල් පවත්නා අංගසම්පූර්ණ වෙනසක්.

අපේ ජනතාව අපේක්ෂා කරන වෙනස්කම් අතර ඉතා ප්‍රමුඛව තිබෙන්නේ, හිංසනය සහ භීෂණය, සම්පූර්ණයෙනුත් සෑම ආකාරයෙනුත් ප්‍රතික්ෂේප කිරීමයි. තමන්ගේ ආදරණීයයන් අමු අමුවේ මරා දමනු ලැබීමේත්, අතුරුදහන් කරනු ලැබීමේත් වේදනාව අපේ ජනතාව මෙතෙක් නිහඬව දරා ගෙන සිටියා. දශක දෙකකට ආසන්න වූ මේ අඳුරු යුගය තුළදී මිනිස්

ජීවිතය රටේ ඉතාම නොවටිනා දෙයක් බවට පත්කර තිබුණා. රාජ්‍ය භීෂණය රජ කරමින් විනාශයේ මාවත දිගේ නොනැවතී ගමන් කළා. දේශපාලන බලය යනු තමන්ගේ පටු සහ ආත්මාර්ථකාමී අරමුණු ඉටුකර ගැනීමේ උපකරණයකට වඩා වැඩි යමක් නොවේ යැයි සැලකූ හදවතක් නැති ආණ්ඩුවක් කළේ, ශිෂ්ටත්වයේ යුක්තියේ සහ සාධාරණත්වයේ සියලු ම පිළිගත් මූලධර්මයන් හිතුමතේ සහ දඬුවම් ලැබීමේ බියකින් තොරව උල්ලංඝනය කර ආත්ම ර කවරණය සහ තෘප්තිය පතා කිසිදු ගුණ ධර්මයක් හෝ සදාචාරාත්මක වටිනාකමක් නොතකමින් අඳුරේ අතපත ගාන සමාජයක් ඉතිරි කර යාමයි.

ශ්‍රී ලංකාවේ ජනතාව ඉතා පැහැදිලිව සහ මහ හඬින් අසන්නට කැමති අයට අසා සිටින්නට, කෑ ගසා කියා ඇති දෙය මෙයයි. : ශක්තිය පමණක් යුක්තිය වූ යුගය, සෑම දෙයක්ම බලයට හා මිලයට ගත හැකි වූ යුගය, සංවිධාන ගතවූ සෑම ආකාරයකම හිංසනය රජය විසින් මුවහත් කර තියුණු කල යුගය, දැන් අවසානයි ජනතාව දැන් තීන්දුව දී තිබෙන්නේ නීතියේ ආධිපත්‍යය වෙනුවෙන්. ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් හා හරයන් ආරක්ෂා කිරීම වෙනුවෙන් ආණ්ඩු කිරීමේ කාර්යයේදී ශිෂ්ටකම, සදාචාරය සහ හෘදය සාක්ෂ්‍යය ප්‍රතිෂ්ඨාපනය කිරීම වෙනුවෙන්.

අපේ ජනත්ාව මෙවර ඉතා තීරණාත්මකව ඡන්දය දී ඇත්තේ ජාතියේ සමාජ හා දේශපාලන දේහයේ අරටුවටම මුල් බැස ගොස් පැතිරී තිබෙන දූෂණය සහ බලය අයථා ලෙස ප්‍රයෝජන ගැනීමට විරුද්ධවයි. ආණ්ඩුවේ සෑම කාර්යයකදීම විවෘතභාවය සහ වගඋත්තර කීම සහතික කළ



යුතු බව ඔවුන් ඉල්ලා සිටිනවා. දේශපාලන බලය යනු හුදෙක් විශ්වාසය මත පැවරෙන ක්‍රියාකාරිත්වයකට වඩා වැඩි යමක් නොවන බවත්, එය සදාචාරාත්මක වශයෙන් සාධාරණීයකරණය කළ හැක්කේ ජනතාවගේ ශුභ සිද්ධිය සහ යහපත වෙනුවෙන් පාවිච්චි කරන තාක් දුරට පමණක් බවත්, ඔවුන් ඉතා තදින් ම අවධාරණය කර තිබෙනවා. දේශපාලඥයන් හිතුමතේ සහ හිතුවක්කාර ලෙසත්, කිසිදු නීතියක් නොතකාත් සිටි යුගය ජනතාව දැන් අවසන් කරලා. දේශපාලන ප්‍රචණ්ඩත්වය සහ රජයේ භීෂණය මුලිනුපුටා දැමීමටත්, අප රටේ දේශපාලනයට අවංකකම සහ ගරුත්වය යළි ගෙනඒමටත්, මගේ ආණ්ඩුව ගත් පියවරට මුළු රටේ ම අනුමැතිය ලැබී තිබෙන්නේ ඉතාම පැහැදිලි ලෙසයි.

අධික ජීවන වියදම් බර සහ අවශ්‍ය තරම් රැකියා නැතිකම සහ අපේ ආර්ථිකය වෙළාගෙන තිබෙන අනික් ප්‍රශ්න නිසා ජනතාවට ඇති වී තිබෙන ආර්ථික දුෂ්කරතා සැහැල්ලු කිරීමට ක්ෂණික පියවර ගැනීම අත්‍යවශ්‍යයි. අපේ රට මෙතෙක් හැඩගැසී තිබුණේ විවෘත ආර්ථිකයේ නාමයෙන් රටේ වැඩි දෙනා දුගී කමෙන් සහ දරිද්‍රතාවෙන් පෙළෙද්දී,

බලයේ සිටින්නන්ගේ හිතවතුන් අතළොස්සකට පමණක් අසාධාරණ වාසි ප්‍රයෝජන ලබාගැනීමට ඉඩප්‍රස්තා දීමේ ආර්ථික ක්‍රමයකටයි. සෞඛ්‍ය හා අධ්‍යාපනය වැනි අත්‍යවශ්‍ය මහජන සේවා ඒ ක්‍රමය තුළ මුළුමනින්ම අමතක කෙරුණා. අපේ ආණ්ඩුවේ ප්‍රමුඛත්වය ලබාදී ඇති කාර්යයක් වන්නේ, අපේ ආර්ථිකය සැබෑ ලෙසම නිදහස් සහ තරගකාරී එකක් බවට පරිවර්තනය කරමින්, සෑම ගනුදෙනුවකදීම අවංකකම හා විවෘතභාවය සහතික කිරීමයි. පැහැදිලි සහ නිරවුල් සංවර්ධන ඉදිරි දර්ශනයක් ඇති විට, ජාතික නිෂ්පාදනය පුළුල් කර, වේගවත් කළ හැකි වනවා ඇති. එමෙන්ම එමගින් අපේ තරුණ පරපුරට නව රැකියා සහ ආර්ථික අවකාශ බිහි කළ හැකි වෙනවා ඇති. ඒ සමගම අපි විදේශ ආයෝජන දිරිගැන්වීමට ක්‍රියා කරන්නෙමු. ඒ සමඟම, සාධාරණ සම කාර්යක්ෂම ආදායම් බෙදීයාමේ ක්‍රම සහ රැකියා අවකාශ වැඩි කිරීම මගින්, සංවර්ධනයේ ප්‍රතිලාභ අපේ ජනතාවගේ ඉතා දුගී අය අතටත් පත්වන බවට, අපි වගබලා ගන්නෙමු.

තමන් වාර්ගික සහ ආගමික අන්තවාදයේත්, වෛරයේත්, අඳුරු බියකරු සහ කුරිරු ආකල්පවල මහා ප්‍රපාතයට ඇද දැමීමට සමහර අය ගත් ප්‍රයත්නයන් ඉදිරියේ අපේ ජනතාව ක්‍රියා කර ඇත්තේ අතිශයින්ම ප්‍රවේශමෙන්, බුද්ධිමත්ව සහ තීක්ෂ්ණ දේශපාලන අවබෝධයකින් යුතුවයි. සාමය සහ මිනිස්කම අගයන හර පද්ධතියක් සඳහා අප ජනතාව සිය අභිලාෂය, එකහෙළාම පළ කර තිබෙනවා. මුළු ලෝකයටම ඔවුන් ඉතා පැහැදිලිවම ඔප්පුකර තිබෙන්නේ වෙඩි උණ්ඩය, කතිරයෙන් පරාජය කළ හැකි බවයි. ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි අප ජනතාව සතු කැපවීම අප හැමදෙනාම මහඟු ලෙස උනන්දු කරවන්නක්. හිංසනය අතහැර දමා, නිදහසේ, ප්‍රජාතන්ත්‍රවාදයේ, ශිෂ්ටත්වයේ සහ සැමටම සෞභාග්‍යය අත්කර දීමේ ධජය එසවීමට අප සමඟ එන්නැයි, අප කළ



කැඳවීමට තරුණ පෙළ දක්වා තිබෙන්නේ ඉතා උණුසුම් ප්‍රතිචාරයක්. අපේ ප්‍රතිඥාවන් ඉටුකිරීමට අප සතු ශක්තිය පිළිබඳව තරුණ පරපුර දක්වා ඇති විශ්වාසයට, මා හිස නමා ආචාර කරනවා.

අපේ රටේ උතුරු කොටසේ යුද්ධය විසින් දායාද කොට ඇත්තේ, ජීවිත සහ සම්පත් මහා පරිමාණ වශයෙන් විනාශ වීමේ ඉරණමයි. ජනතාව අපට දී ඇති වරමින්, අංශු මාත්‍රයකවත් සැකයකින් තොරව පෙනෙන්නේ සාමය සඳහා ඔවුන් සතු ශ්‍රේෂ්ඨ අභිලාෂය කෙතරම් ගැඹුරු සහ පුළුල් එකක් ද යන්නයි. කෙසේ වුවත්, සාමය යනු ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් දෙකටම ගෞරව සම්පන්නව ලබාගත යුතු දෙයක්. එමෙන්ම එය ශක්තිමත් සහ කල්පවත්නා සාමයක් විය යුතුයි. සාමය සඳහා ඇති මාවත දුෂ්කර සහ කටු කොහොල්වලින් ගහන එකක් බව පිළිගනිමින් මාත්, මගේ ආණ්ඩුවත් සාමය සොයා අප යන ගමනේ දිගටම යෙදෙනවා ඇති. සාමය සඳහා වූ අපේ ප්‍රවේශය, සිංහල ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවට නිසි සැලකිල්ල දක්වමින්, සෑම ජනවාර්ගික

කොටසකගේම ආත්ම ගෞරවය සහ සමාන ලෙස සලකනු ලැබීම, පිළිගැනීමේ අවශ්‍යතාව අනුව සකස් වූ එකක් බවට අප විශ්වාස කරනවා.

අපේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී ජීවන රටාවට, විධායක ජනාධිපති ආණ්ඩු ක්‍රමයෙන් සිදු වී ඇති පුළුව කළ නොහැකි හානිය මනා ලෙස තේරුම් ගෙන ඇති අප, ගෞරව බහුමානයෙන් යුතුව ඔබට දෙන ප්‍රතිඥාව නම්, මේ පිළිකාව අපේ රටේ ආණ්ඩු ක්‍රමයෙන් සපුරා ඉවත් කරන බවයි.

මේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස මා සහ මගේ නායකත්වයෙන් ඇති ආණ්ඩුව කැපවන බවට ඔබට ප්‍රතිඥා දෙමින්, ඔබ අපට දී ඇති සහයෝගය ඉදිරියටත් එලෙසම ලබා දෙන ලෙස මා ඔබෙන් ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. අපේ ඉදිරි මඟ ආලෝකවත් කරන පහන් ටැඹ වන්නේ, ඔබ අප වෙත තබා ඇති බලාපොරොත්තු සහ විශ්වාසයයි. අපට ඉදිරියට පිය නගන්නට අවශ්‍ය ධෛර්යය සහ කැපවීම ලැබෙන්නේ ඔබ අපට දෙන සහයෝගය සහ මඟ පෙන්වීමෙනුයි.

බලාපොරොත්තුවේ ගිරිකුළ මුදුණට
අපි එකට පිය නගමු.
ඒ දුෂ්කර එහෙත් මියුරු සිහිනය
සැබෑවක්ම කර ගනිමු.

අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය
ජනාධිපතිනිය ලෙස දිවුරුම් දීමෙන් පසු
ජාතිය අමතා කළ කථාව
1994 නොවැම්බර් මස 12 වන දින

# අමාත්‍ය මණ්ඩලය

ජනාධිපති, බුද්ධ ශාසන, ආරක්ෂක මුදල් ක්‍රමසම්පාදන, ජනවාර්ගික හා ජාතික ඒකාබද්ධතා ගරු අමාත්‍ය
**චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනිය**

අග්‍රාමාත්‍ය
**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මැතිනිය**

වාරිමාර්ග, විදුලිබල හා බලශක්ති ගරු අමාත්‍ය හා ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍ය-
**අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා**

ජනමාධ්‍ය, සංචාරක කටයුතු හා ගුවන් සේවා ගරු අමාත්‍ය-
**ධර්මසිරි සේනානායක මැතිතුමා**

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි කර්මාන්ත සහ පාර්ලිමේන්තු කටයුතු ගරු අමාත්‍ය-
**රත්නසිරි වික්‍රමනායක මැතිතුමා.**

අධිකරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු ගරු අමාත්‍ය-
**මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා**

විදේශ වෙළෙඳාම, වෙළෙඳ වාණිජ හා ආහාර ගරු අමාත්‍ය-
**කිංස්ලි තිස්ස වික්‍රමරත්න මැතිතුමා**

කෘෂිකර්ම ඉඩම් සහ වනසම්පත් ගරු අමාත්‍ය-
**දි. මු.ජයරත්න මැතිතුමා**

කර්මාන්ත සංවර්ධන ගරු අමාත්‍ය-
**සී. වී ගුණරත්න මැතිතුමා**

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ගරු අමාත්‍ය-
**රිචඩ් පතිරණ මැතිතුමා**

නිවාස, ඉදිකිරීම්, සහ මහජන උපයෝගිතා ගරු අමාත්‍ය-
**නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා**

කම්කරු හා වෘත්තීය පුහුණු ගරු අමාත්‍ය-
**මහින්ද රාජපක්ෂ මැතිතුමා**

සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජසේවා ගරු අමාත්‍ය-
**ඒ. එච්. එම්. ෆවුසි මැතිතුමා**

ප්‍රවාහන, පරිසර හා වනිතා කටයුතු ගරු අමාත්‍ය-
**ශ්‍රීමතී අතුලත්මුදලි මැතිනිය**

තැපැල් හා විදුලි සංදේශ ගරු අමාත්‍ය-
**මංගල සමරවීර මැතිතුමා**

ධීවර හා ජලජ සම්පත් ගරු අමාත්‍ය-
**ඉන්දික ගුණවර්ධන මැතිතුමා**

සංස්කෘතික හා ආගමික කටයුතු ගරු අමාත්‍ය-
**ලක්ෂ්මන් ජයකොඩි මැතිතුමා**



විද්‍යා, තාක්ෂණ හා මිනිස් සම්පත් සංවර්ධන ගරු අමාත්‍ය–
බර්නාඩ් සොයිසා මැතිතුමා

සමුපකාර පළාත් සභා හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍ය–
අමරසිරි දොඩන්ගොඩ මැතිතුමා

නාවික, වාරය, පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ ගරු අමාත්‍ය–
හුසේන් මුහම්මද් අෂ්රප් මැතිතුමා

යෞවන කටයුතු, ක්‍රීඩා හා ග්‍රාම සංවර්ධන ගරු අමාත්‍ය–
එස්. බී. දිසානායක මැතිතුමා

පශු සම්පත් සංවර්ධන හා ග්‍රාමීය කර්මාන්ත ගරු අමාත්‍ය–
සෞම්‍යමූර්ති තොණ්ඩමාන් මැතිතුමා

විදේශ කටයුතු ගරු අමාත්‍ය–
ලක්ෂ්මන් කදිර්ගාමර් මැතිතුමා

## නියෝජ්‍ය අමාත්‍යවරු

මුදල් ගරු නියෝජ්‍ය අමාත්‍ය - (එතුමාගේ අමාත්‍ය මණ්ඩල තනතුරට අමතරව)
මහාචාර්ය ජී. එල්. පීරිස් මැතිතුමා

අධිකරණ සහ ව්‍යවස්ථා කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය -
පී. බී. ජී. කළුගල්ල මැතිතුමා

විදේශ කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය -
ඩී. පී. වික්‍රමසිංහ මැතිතුමා

කෘෂිකර්ම ගරු නියෝජ්‍ය අමාත්‍ය -
සමරවීර වීරවන්නි මැතිතුමා

රාජ්‍ය පරිපාලන, වැවිලි කර්මාන්ත සහ පාර්ලිමේන්තු කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය -
අනුරුද්ධ සෙනෙවිරත්න මැතිතුමා

කම්කරු සහ වෘත්තීය පුහුණු ගරු නියෝජ්‍ය අමාත්‍ය -
මොන්ටි ගොපල්ලව මැතිතුමා

නාවික, වරාය, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ ගරු නියෝජ්‍ය අමාත්‍ය -
මහින්ද විජේසේකර මැතිතුමා

බුද්ධ ශාසන ගරු නියෝජ්‍ය අමාත්‍ය -
සුමේධා ජයසේන මැතිනිය

ක්‍රමසම්පාදන, ජනවාර්ගික කටයුතු සහ ජාතික ඒකාබද්ධතා ගරු නියෝජ්‍ය අමාත්‍ය –
ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ මැතිතුමා

ඉඩම් සහ වන සම්පත් ගරු නියෝජ්‍ය අමාත්‍ය –
නන්දිමිත්‍ර ඒකනායක මැතිතුමා

තැපැල් සහ විදුලි සංදේශ ගරු නියෝජ්‍ය අමාත්‍ය –
එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මැතිතුමා

වාරිමාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය –
මෛත්‍රිපාල සිරිසේන මැතිතුමා

ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍ය –
මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා

විද්‍යා, තාක්ෂණ සහ මිනිස් සම්පත් සංවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍ය –
එස්. එස්. එම්. අබූබකර් මැතිතුමා

කර්මාන්ත සංවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍ය –
බර්ටි දිසානායක මැතිතුමා

නිවාස සහ ඉදිකිරීම් ගරු නියෝජ්‍ය අමාත්‍ය –
එස්. බී. නාවින්න මැතිතුමා

ජනමාධ්‍ය ගරු නියෝජ්‍ය අමාත්‍ය –
අලෙවි මවුලානා මැතිතුමා

යෞවන කටයුතු, ක්‍රීඩා සහ ග්‍රාම සංවර්ධන ගරු නියෝජ්‍ය අමාත්‍ය –
ජීවන් කුමාරණතුංග මැතිතුමා

සමුපකාර, පළාත් සභා සහ දේශීය වෛද්‍ය ගරු නියෝජ්‍ය අමාත්‍ය –
සී. ගජදීර මැතිතුමා

මහජන උපයෝගිතා සහ වතු නිවාස ගරු නියෝජ්‍ය අමාත්‍ය –
පී. චන්ද්‍රසේකරන් මැතිතුමා

විදුලිබල සහ බලශක්ති ගරු නියෝජ්‍ය අමාත්‍ය –
අතුල නිමලසිරි ජයසිංහ මැතිතුමා

සංචාරක සහ සිවිල් ගුවන් සේවා ගරු නියෝජ්‍ය අමාත්‍ය –
නිරූපමා රාජපක්ෂ මැතිනිය

සෞඛ්‍ය, මහාමාර්ග සහ සමාජ සේවා ගරු නියෝජ්‍ය අමාත්‍ය –
පවිත්‍රා වන්නිආරච්චි මැතිනිය

උසස් අධ්‍යාපන ගරු නියෝජ්‍ය අමාත්‍ය –
මහාචාර්ය විශ්ව වර්ණපාල මැතිතුමා

සංස්කෘතික සහ ආගමික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය –
මහාචාර්ය ඒ. වී. සුරවීර මැතිතුමා



දේශීය හා විදේශීය වෙළෙඳ, වාණිජ සහ ආහාර ගරු නියෝජ්‍ය අමාත්‍ය -
**ප්‍රියංගනි අබේවීර මැතිනිය**

ස්වදේශ කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය -
**ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා**

ප්‍රවාහන, පරිසර සහ වනිතා කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය -
**රෙජී රණතුංග මැතිතුමා**

පශු සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය කර්මාන්ත ගරු නියෝජ්‍ය අමාත්‍ය -
**හේමා රත්නායක මැතිනිය**

අධ්‍යාපන ගරු නියෝජ්‍ය අමාත්‍ය -
**ජෝන් සෙනෙවිරත්න මැතිතුමා**

# ජනාධිපතිවරණයේ ප්‍රතිඵල

| දිස්ත්‍රික්ක | පො.පෙ. | එ.ජා.ප. | ප්‍රගති. පෙර. | ස්වා1 | ස්වා2 | භූමි පුත්‍ර | වලංගු ඡන්ද | ප්‍රතික්. ඡන්ද | ඡන්දය දුන් සංඛ්‍යා. |
|---|---|---|---|---|---|---|---|---|---|
| කොළඹ | 5,57,708 | 2,88,741 | 1,819 | 3,533 | 2,526 | 6,059 | 8,60,386 | 16,060 | 8,76,446 |
| 12,35,959 | 64.82% | 33.56% | 0.21% | 0.41% | 0.29% | 0.70% | 98.17% | 1.83% | 70.91% |
| ගම්පහ | 5,50,654 | 2,88,608 | 1,832 | 2,711 | 3,019 | 3,694 | 8,50,518 | 13,137 | 8,63,655 |
| 11,40,808 | 64.74% | 33.93% | 0.22% | 0.32% | 0.35% | 0.43% | 98.48% | 1.52% | 75.71% |
| කළුතර | 2,95,686 | 1,78,466 | 1,388 | 1,398 | 2,213 | 1,868 | 4,81,019 | 7,309 | 4,88,328 |
| 6,46,119 | 61.47% | 37.10% | 0.29% | 0.29% | 0.46% | 0.39% | 98.50% | 1.50% | 75.57% |
| මහනුවර | 3,20,110 | 2,35,519 | 1,370 | 1,752 | 3,748 | 2,618 | 5,65,117 | 14,179 | 5,79,296 |
| 7,26,192 | 56.64% | 41.68% | 0.24% | 0.31% | 0.66% | 0.46% | 97.55% | 2.45% | 79.77% |
| මාතලේ | 1,21,449 | 73,324 | 680 | 608 | 2,111 | 992 | 1,99,164 | 5,317 | 2,04,481 |
| 2,50,816 | 60.98% | 36.82% | 0.34% | 0.31% | 1.06% | 0.50% | 97.40% | 2.60% | 81.53% |

| දිස්ත්‍රික්ක | පො.පෙ. | එ.ජා.ප | ප්‍රගති. පෙරමු | ස්වා1 | ස්වා2 | භූමි පුත්‍ර | වලංගු ඡන්ද | ප්‍රතික්. ඡන්ද | ඡන්දය දුන් සංඛ |
|---|---|---|---|---|---|---|---|---|---|
| **නුවරඑළිය** | **1,68,929** | **1,16,928** | **1,044** | **1,083** | **6,314** | **1,332** | **2,95,630** | **11,840** | **3,07,470** |
| 3,86,668 | 57..4% | 39.55% | 0.35% | 0.37% | 2.14% | 0.45% | 96.15% | 3.85% | 79.52% |
| **ගාල්ල** | **2,85,398** | **1,73,282** | **1,487** | **1,179** | **1,885** | **1,584** | **4,64,815** | **7,112** | **4,71,927** |
| 6,32,412 | 61.40% | 37.28% | 0.32% | 0.25% | 0.41% | 0.34% | 98.49% | 1.51% | 74.62% |
| **මාතර** | **2,27,865** | **1,18,224** | **1,397** | **1,134** | **2,055** | **1,564** | **3,52,239** | **5,731** | **3,57,970** |
| 5,04,470 | 64.69% | 33.56% | 0.40% | 0.32% | 0.58% | 0.44% | 98.40% | 1.60% | 71.10% |
| **හම්බන්තොට** | **1,32,873** | **77,735** | **1,685** | **750** | **1,414** | **1,538** | **2,15,995** | **4,013** | **2,20,008** |
| 3,26,913 | 61.52% | 35.99% | 0.78% | 0.35% | 0.65% | 0.71% | 98.18% | 1.82% | 67.30% |
| **යාපනය** | **16,934** | **223** | **25** | **16** | **341** | **36** | **17,575** | **141** | **17,716** |
| 5,96,366 | 96.35% | 1.27% | 0.14% | 0.09% | 1.94% | 0.20% | 99.20% | 0.80% | 2.97% |
| **වවුනියා** | **33,585** | **4,493** | **118** | **77** | **1,003** | **96** | **39,372** | **681** | **40,053** |
| 1,78,697 | 85.30% | 11.41% | 0.30% | 0.20% | 2.55% | 0.24% | 98.30% | 1.70% | 22.41% |

| දිස්ත්‍රික්ක | පො.පෙ. | එ.ජා.ප. | ප්‍රගති. පෙරමු | ස්වා1 | ස්වා2 | භූමි පුත්‍ර | වලංගු ඡන්ද | ප්‍රතික්. ඡන්ද | ඡන්දය දුන් සංඛ |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මඩකලපුව** | **1,44,725** | **14,812** | **484** | **381** | **5,028** | **349** | **1,65,779** | **2,664** | **1,68,443** |
| 2,61,897 | 87.30% | 8.93% | 0.29% | 0.23% | 3.03% | 0.21% | 98.42% | 1.58% | 64.32% |
| **දිගාමඩුල්ල** | **1,68,289** | **59,074** | **574** | **496** | **3,677** | **471** | **2,32,581** | **3,621** | **2,36,202** |
| 3,12,006 | 72.36% | 25.40% | 0.25% | 0.21% | 1.58% | 0.20% | 98.47% | 1.53% | 75.70% |
| **ත්‍රිකුණාමලය** | **77,943** | **28,006** | **324** | **195** | **2,074** | **279** | **1,08,821** | **1,726** | **1,10,547** |
| 1,84,090 | 71.62% | 25.74% | 0.30% | 0.18% | 1.91% | 0.26% | 98.44% | 1.56% | 60.05% |
| **කුරුණෑගල** | **4,03,838** | **2,66,740** | **1,842** | **1,714** | **3,999** | **2,211** | **6,80,344** | **10,511** | **6,90,855** |
| 8,76,591 | 59.36% | 39.21% | 0.27% | 0.25% | 0.59% | 0.32% | 98.48% | 1.52% | 78.81% |
| **පුත්තලම** | **1,65,795** | **95,211** | **625** | **591** | **1,796** | **617** | **2,64,635** | **4,689** | **2,69,324** |
| 3,80,872 | 62.65% | 35.98% | 0.24% | 0.22% | 0.68% | 0.23% | 98.26% | 1.74% | 70.71% |
| **අනුරාධපුර** | **2,00,146** | **1,07,342** | **1,083** | **678** | **2,534** | **1,014** | **3,12,797** | **6,205** | **3,19,002** |
| 4,06,926 | 63.99% | 34.32% | 0.35% | 0.22% | 0.81% | 0.32% | 98.05% | 1.95% | 78.39% |

| දිස්ත්‍රික්ක | පො.පෙ. | එ.ජා.ප. | ප්‍රගති. පෙරමු | ස්වා1 | ස්වා2 | භූමි පුත්‍ර | වලංගු ඡන්ද | ප්‍රතික්. ඡන්ද | ඡන්දය දුන් සංඛ |
|---|---|---|---|---|---|---|---|---|---|
| පොළොන්නරුව | 88,907 | 59,287 | 469 | 258 | 1,126 | 428 | 1,50,475 | 3,966 | 1,54,441 |
| 2,00,192 | 59.08% | 39.40% | 0.31% | 0.17% | 0.75% | 0.28% | 97.43% | 2.57% | 77.15% |
| බදුල්ල | 1,82,810 | 1,39,611 | 1,372 | 1,387 | 3,847 | 1,745 | 3,30,772 | 14,093 | 3,44,865 |
| 4,35,260 | 55.27% | 42.21% | 0.41% | 0.42% | 1.16% | 0.53% | 95.91% | 4.09% | 79.23% |
| මොනරාගල | 96,620 | 52,026 | 824 | 556 | 1,966 | 877 | 1,52,869 | 3,977 | 1,56,846 |
| 1,99,391 | 63.20% | 34.03% | 0.54% | 0.36% | 1.29% | 0.57% | 97.46% | 2.54% | 78.66% |
| රත්නපුරය | 2,57,265 | 1,77,924 | 1,279 | 1,235 | 3,451 | 1,877 | 4,43,031 | 7,595 | 4,50,626 |
| 5,54,607 | 58.07% | 40.16% | 0.29% | 0.28% | 0.78% | 0.42% | 98.31% | 1.69% | 81.25% |
| කෑගල්ල | 2,11,676 | 1,59,707 | 1,028 | 1,020 | 2,759 | 1,402 | 3,77,592 | 7,139 | 3,84,731 |
| 5,00,947 | 56.06% | 42.30% | 0.27% | 0.27% | 0.73% | 0.37% | 98.14% | 1.86% | 76.80% |
| **එකතුව** | **47,09,205** | **27,15,283** | **22,749** | **22,752** | **58,886** | **32,651** | **75,61,526** | **1,51,706** | **77,13,232** |
| **1,09,37;279** | **62.28%** | **35.91%** | **0.30%** | **0.30%** | **0.78%** | **0.43%** | **98.03%** | **1.97%** | **70.52%** |

පො.පෙ. - චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග (පොදුජන එක්සත් පෙරමුණ), එ.ජා.ප.- ශ්‍රීමා දිසානායක (එක්සත් ජාතික පක්ෂය), ප්‍රගති.පෙරමු. - නිහාල් ගලප්පත්ති (ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ), ස්වා.1 ඒ.ජේ.රණසිංහ (ස්වාධීන), ස්වා.2 - හඩ්සන් සමරසිංහ (ස්වාධීන), භූමිපුත්‍ර. හරිශ්චන්ද්‍ර විජයතුංග ( සිංහලයේ මහා සම්මත භූමිපුත්‍ර පක්ෂය), වලංගු ඡන්ද - වලංගු ඡන්ද සංඛ්‍යාව, ප්‍රතික්. ඡන්ද - ප්‍රතික්ෂේපිත ඡන්ද සංඛ්‍යාව, දුන් ඡන්ද සංඛ.- ඡන්ද දුන් සංඛ්‍යාව.

REFERENCE

සංස්කරණය හා සැකසුම
දෙසතිය සහරාවේ සංස්කාරක මණ්ඩලය
ප්‍රකාශනය
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
මුද්‍රණය
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

ජනාධිපති කාර්යාලය
පුස්තකාලය


ශක්තිය පමණක්
ශක්තිය වූ යුගය.
සෑම දෙයක්ම බලයට හා